# ගාන්ධිතුමාගේ අධ්‍යාපන දර්ශනය

**දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**

## 01. හැඳින්වීම

අධ්‍යාපනය වනාහි මානවයාගේ ක්‍රියාකාරීත්වයෙහි අතිශය විශිෂ්ට හා දියුණු ශිෂ්ට සභ්‍යත්වයක මූලික සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. ගල් යුග, වැදි යුග ඇතුළු විවිධ යුග හරහා නූතන පරිගණක යුගය දක්වා කටු පඳුරු, වන ලැහැබ්, ගිරි ශිඛර මෙන් ම ජල තල, මුඩු බිම් හා සරු බිම් ඇතුළත් වර්ග කිලෝමීටර මිලියන පන්සිය දහයක් (510,000,000KM2) වන පෘථිවි තලය මත සිට ආලෝක වර්ෂ බිලියන අනු තුනක් වන විශ්වයත් තෙරක් නොපෙනෙන නැතහොත් අසීමාන්තික පරාසයක් පුරා විහිදී ඇති පුද්ගල අභ්‍යන්තරයත් පිළිබඳ පාරම්පරික අත්දැකීම් හා ඥාන සමුදාය අනාගතය දක්වා වැඩි දියුණු කරමින් සිය ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය කරන මෙවලම අධ්‍යාපනය යි. එබැවින් අධ්‍යාපනය අවශ්‍ය නොවන තත්ත්වයක් හෝ ක්ෂේත්‍රයක් සිතාගත නොහැකි වන අතර මේ මොහොත වනාහි අධ්‍යාපනයෙහි එක් ප්‍රතිඵලයක් පමණි. ඕනෑ ම දෙයකට දර්ශනයක් තිබෙන අතර දර්ශනයෙන් තොර පැවැත්ම හානි දායක ය. පැවැත්මෙන් තොර දර්ශනය ඵලක් නැත. පැවැත්ම උදෙසා දර්ශනයත් දර්ශනය උදෙසා පැවැත්මත් අත්‍යාවශ්‍ය වේ. එමෙන් ම දර්ශනයෙන් තොර අධ්‍යාපනය හානි දායක ය. අධ්‍යාපනයෙන් තොර දර්ශනය ඵලක් නැත. එදාමෙදා තුර අධ්‍යාපනය හා දර්ශනය එක් ව විකාශය වී අධ්‍යාපනය විෂය පෝෂණය වෙනුවෙන් ඉමහත් සේවාවක් ඉටු වී ඇති අතර අධ්‍යාපනයෙහි දර්ශනය වෙනුවෙන් ප්‍රබල දායකත්වයක් සපයන ලද භාරතීය චින්තනයෙහි ද යුග පුරුෂයෙකු වූ මහත්මා ගාන්ධිගේ අධ්‍යාපන දර්ශනයෙහි වැදගත්කම මතුකරගැනීම වෙනුවෙන් මෙම ශාස්ත්‍රීය දායකත්වය සිදු කෙරේ.

ගාන්ධිතුමාගේ අධ්‍යාපන දර්ශනයෙහි වැදගත්කම හා එහි නූතන ප්‍රවණතාවල ස්වභාවය කෙබඳුද? යන මූලික පර්යේෂණ ගැටලුව තේමා කරගත් මෙම පර්යේෂණයේ දී දැනට අධ්‍යාපන දර්ශනය

ක්ෂේත්‍රයට දායකත්වය සපයන මහත්මා ගාන්ධිගේ අධ්‍යාපන දර්ශනය ජගත් ප්‍රජාව පැතිකඩ ගණනාවකින් සිය ඉගෙනුම්-ඉැන්වීම් ක්‍රියාවලියට දායක කරගෙන තිබෙන අයුරු දැකගත හැකි බව ද දැක්විය යුතු ය. මූලික වශයෙන් මෙම පර්යේෂණය මූලාශ්‍රය අධ්‍යයනයක් වන අතර අධ්‍යාපනය හා ගාන්ධිතුමා පිළිබඳ කරුණු අන්තර්ගත මූලාශ්‍රයවලින් ගන්නා ලද දත්ත සංධාර විශ්ලේෂණයෙන් ඉදිරිපත් කෙරේ.

භාරතීය චින්තාවලිය තුළ පමණක් නොව ගෝලීය චින්තාවලියේ ද සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස මහත්මා ගාන්ධි (Mahatma Gandhi) හෙවත් මොහාන්දාස් කරම්චන්ද් ගාන්ධි (Mohandas Karamchand Gandhi) හට හිමි වේ. වර්ෂ 1869 ඔක්තෝම්බර් දෙවන දා ගුජරාට්හි පෝබොර්න්ඩර්වල උපත ලද මෙතුමා නවදිල්ලියේ දී මිය පරලොව යන්නේ 1948 ජනවාරි 30 දා වන අතර වසර හැත්තෑ අටක (78) ආයු කාලය තුළ කළ, කී දෑ අනුස්මරණය වසර හැත්තෑ හතක් (77) ගත වී ඇතත් අඛණ්ඩ ව ඇගයීමට පාත්‍ර කිරීම ම අතිශය වැදගත්කම් මතු කිරීමට හේතු වීමකි. එබැවින් කිසිසේත් ම ගාන්ධිතුමා පිළිබඳ අවධානයෙන් මිදීම කළ නොහැක්කක් බව මාර්ටින් ලූතර් කිං (Martin Luther King) අවධාරණය කරන්නේ මනුෂ්‍යත්වයෙහි දියුණුව අපේක්ෂා කරන්නේ නම් ගාන්ධි අත්හැරිය නොහැකි බවත් සාමය හා සමගියෙන් පිරි ලෝකයක් කරා මානව වර්ගයාගේ පරිණාමය පිළිබඳ දර්ශනයෙන් ආභාෂය ලබා ජීවත් වූ, සිතූ සහ ක්‍රියා කළ ඔහුව අපට අපගේ ම අවධානමක් මත නොසලකා හැරිය හැකි බව යි. රාඝවන් අයියර්ට (Raghavan Iyer) අනුව ගාන්ධිතුමාගේ අවිහිංසාවාදය හුදෙක් දේශපාලන උපාය මාර්ගයක් නොව, සත්‍යය තුළ මුල් බැසගත් පුළුල් සදාචාරාත්මක හා අධ්‍යාත්මික දැක්මකි. ජෝන් බොන්ඩුරන්ට් (Joan Bondurant) පෙන්වා දෙන්නේ ගාන්ධිගේ දේශපාලන දර්ශනය එක වචනයකින් සාරාංශ කළ හැකි බවත් එය අවිහිංසාව වන නමුත් එම එක් වචනය මානව සබඳතාවල සමස්ත විශ්වයක් ම ආවරණය කරන බව යි. ගාන්ධිගේ චින්තනය සිදුකළ ගෝලීය බලපෑම ඇගයීමට ලක්කරන ඇල්බට් අයින්ස්ටයින් (Albert Einstein) පෙන්වා දෙන්නේ මෙවැනි කෙනෙකු මස් හා ලේ වලින් මේ පොළොව මත ඇවිද ගිය බව අනාගත පරම්පරාවන් විශ්වාස නොකරනු ඇති බව යි. එක්නාත් ඊශ්වරන් (Eknath Easwaran) දක්වන්නේ ගාන්ධි ඉන්දියාවට පමණක් නොව මුළු ලෝකයට ම අයත් බවත් ඔහුගේ පණිවිඩය දේශපාලන

නිදහසට පමණක් සීමා නොවූ අතර, මනුෂ්‍යත්වයේ අධ්‍යාත්මික නිදහසට ද සීමා වූ බවත් ය. ගාන්ධිතුමාගේ ශ්‍රේෂ්ඨත්වය රැඳී තිබුණේ සදාචාරාත්මක මූලධර්මය සමාජ බලයක් බවට පත් කිරීමේ ඔහුගේ හැකියාව තුළ බව දක්වමින් එතුමාගේ චින්තනය ජුඩිත් බ්‍රවුන් (Judith Brown) ද ඇගයීමට ලක්කර ඇත.

## 02. ගාන්ධිතුමා හා දර්ශනය

ගාන්ධි තුමාගේ දර්ශනය ගැඹුරු, ප්‍රභූවරුනට සීමා වූ සංකීර්ණ මූලාශ්‍රය පරිචයකින් යුක්ත වූවක් නොවේ. වඩාත් සරල මෙන් ම ප්‍රායෝගික ප්‍රවේශයකින් යුක්ත වූ එය සදාචාරාත්මක, ආධ්‍යාත්මික හා මානව හිතවාදී මූලධර්මවලින් යුක්ත වූවකි. එය දැඩි හා දුෂ්කර ප්‍රතිපත්තිවලින් මිදුණු පුද්ගල හා සමාජ සංවර්ධනය පදනම් කරගත්තකි. ඒ අනුව සත්‍යය, අවිහිංසාව, සත්‍යග්‍රහ, ආත්ම දමනය හෙවත් ස්වරාජ් සංකල්පය, සරල දිවිපැවැත්ම, ආගමික සහජීවනය හා සර්වෝදය වැනි සංකල්පවලින් යුතු වූවකි.

ගාන්ධි තුමාගේ දර්ශනය ප්‍රතිපත්තිගරුක වූ අතර එය සාධාරණත්වය හා සමානාත්මතාවය සමඟ ඒකාබද්ධ වූ නිසා ම සත්‍යග්‍රහ, සිරගතවීම්, පා ගමන්, විරෝධතා හා උපවාස ආදියෙන් ද අවසන් හුස්ම හෙළීම ද ඊට අදාළ ව ම සිදු වූවක් බව දැක්විය යුතු ය (අලහකෝන්, 2006ඃ පි. 94-96). එංගලන්තයේ දී නීති අධ්‍යාපනය ලැබූ හෙතෙම හින්දු - මුස්ලිම් මහජන අයිතීන් උදෙසා අවිහිංසා සටන් දියත් කරමින් ගෞරවාදරයට පාත්‍ර වූවේ ය. සෑම ආගමකට ම ගරු කළ මෙතුමා ඉන්දියානු ජාතික කොංග්‍රසයේ නායකත්වය ද දැරූ අතර දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය, කාන්තා අයිතීන්, ජාතීන් අතර ආගමික සහජීවනය, ජාතීන් අතර මිත්‍රත්වය, කුල ක්‍රමය පිටුදැකීම හා ස්වයං පෝෂිත ආර්ථිකය ආදිය වෙනුවෙන් පුරෝගාමී වූවෙකි (ගුණවර්ධන, 2013ඃ පි. 19). බ්‍රිතාන්‍ය ජාතීන්ගෙන් ඉන්දියාව නිදහස් කරගැනීමේ ද පුරෝගාමි වූවෙකි (ගුණවර්ධන, 2013ඃ පි.19). ජවහර්ලාල් නේරු තුමාගේ කාර්මිකකරණ වැඩසටහනට සහාය වූ හෙතෙම සියතින් ම චරකය නිපදවා ස්වයං පෝෂිත ග්‍රාම සංවර්ධන සැලැස්ම භාරතය පුරා විහිදුවා හැරියේ ය (ගුණවර්ධන, 2013ඃ පි.19). එසේ ම ජම්නාලාල් බජාජ්, ජී.ඩී බිර්ලා, මොතිලාල් නේරු

විනෝභාබාවේ, රාජගෝපා ලාචාරි, රාජේන්ද්‍ර ප්‍රසාද්, සර්දාල් පතේල්, සරෝජනී නායිදු හා පණ්ඩිත විජයලක්ෂ්මී වැනි ප්‍රබල දේශීය නායකත්ව සමග අත්වැල් බැඳගත් මෙතුමා ජාතික සංවර්ධනය වෙනුවෙන් නැගී සිටියේ ය. ජාතියක නැගීම හෝ වැටීම රඳාපවතින්නේ එහි පහළ වන ශ්‍රේෂ්ඨ පුරුෂයන් මත බව ගාන්ධි තුමාගේ මතය විය (වික්‍රමසිංහ, 1994ඃ පි. 5).

ඉන්දියානු ජාතියේ පියා, ජාතියේ පියා යන විරුදාවලීන්ගෙන් මෙන් ම ගෞරවය නිසා ම බාපු ලෙස ද හඳුන්වන මෙතුමා අවිහිංසාව සිය ප්‍රධාන චින්තය කරගත් බව සඳහන් වේ. දකුණු අප්‍රිකාවේ දී ඉන්දයානුවන් මුහුණ දුන් දේශපාලන, සමාජ හා ආර්ථික මර්දන, පීඩන හා අසාධාරණකම්වලට එරෙහි ව ගාන්ධි යොදාගත් සදාචාරවත් මූලධර්මමය ප්‍රධානතම මෙවලම සත්‍යග්‍රහය යි. සහයෝගීතා වර්ජනය, සිවිල් නීතියට අවනත නොවීම හා ආධ්‍යාත්මිකත්වය ද මුසු කොටගත් එය අවිහිංසාවාදී ප්‍රවේශයකි. සත්‍යග්‍රහය වනාහි සත්‍ය පදනම් කරගත්තකි. අවිහංසාව සත්‍යයෙහි ප්‍රධාන ම ස්වාභාවික සිද්ධාන්තය යි. අවිහිංසාව හා සත්‍ය එක ම කාසියක දෙපැත්ත මෙනි (විජේසූරිය, 1999ඃ පි. 166). ගාන්ධිතුමා මෙම සත්‍යවාදී අවිහිංසාව අතිශය දුෂ්කර අවස්ථාවන්හි දී ඉවසීමටත් ගැටුමෙන් තොර වීමටත් උපයෝගී කරගන්නා ආකාරය ප්‍රායෝගික ව ම සිය අනුගාමිකයන්ට පෙන්වා දී ඇත.

ගාන්ධිතුමා චාම් හා අල්පේච්ඡ දිවියක් ප්‍රිය කළ අයෙකි. සාමාන්‍ය භාෂාවෙහි පටන් සාමාන්‍ය ආහාර, ඇඳුම්-පැළඳුම් ප්‍රිය කළ එතුමා මස්-මාංශ හා මත්ද්‍රව්‍ය පරිභෝජනයෙන් මිදුණු අතර බයිබලයෙහි කන්ද උඩ දේශනාව මෙන් ම භාරතීය ආගමික මූලාශ්‍රය පරිශීලනය කරන්නට ද විය (විජේසූරිය, 1999ඃ පි. 15). පැරණි දාර්ශනිකයන් ගත් මග අනුව ස්වාභාව දහම අධ්‍යයනය කළේ ය. ගාන්ධියානු දර්ශනයෙහි සුවිශේෂ අංගයක් ලෙස සමාජ සුබසාධනය උදෙසා වන සර්වෝදය වැඩසටහන හඳුන්වා දිය හැකි අතර එය ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රාජ්‍යවල ද ව්‍යාප්ත ව ඇත.

## 03. අධ්‍යාපන දර්ශනය

අධ්‍යාපනය යනු පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියක් වන අතර එය ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම, රසවිඳීම, පුහුණුව ආදී පුළුල් ක්ෂේත්‍රය රැසක් සම්බන්ධ වන බව පෙනේ. එක් අතකින් අධ්‍යාපනය වනාහි පුද්ගල සංවර්ධන ක්‍රියාවලියකි. අධ්‍යාපනය යන්නෙන් මතු කොට පිටතට ගැනීම, පිටතට මතු කරදීම, භාවිතය මාර්ගයෙන් වර්ධනය යන අර්ථ මතු වේ. ඒ අනුව අධ්‍යාපනය යන්නෙන් අදහස් වන්නේ පුද්ගලයාගේ පූර්ණ ශක්ති වර්ධනය යි.

අධ්‍යාපනය යනු මනුෂ්‍ය සංහතියේ හැම කෙනෙකුගේ ම අවශ්‍යතා සපයා ගැනීමට හා ඔහුගේ අභිවෘද්ධිය සලසා ගැනීමට මගපාදා දීම ද, ඔහුගේ අයිතිවාසිකම් හඳුනාගෙන එයින් ප්‍රයෝජනය ගැනීමට හා යුතුකම් අවබෝධ කර ගෙන එය ඉටු කිරීමට කරුණු සලසා දීම ද, එක් එක් මිනිසා තුළ සහජයෙන් පිහිටි දක්ෂතා වර්ධනය කරමින්, තමාට සහභාගී වන්නට අයිතිකමක් ඇති සමාජ සේවාවන්හි යෙදීමට හැකියාවක් ලබාදීමෙන් නීතියෙන් ඇති කරන ලද සමානාත්මතාව සාක්ෂාත් කිරීම ද සමාජයේ වැඩිදෙනාගේ සුබ විහරණය සලසා දීම ද වේ. ගාන්ධියානු චින්තනයට අනුව හිස (Head), හදවත (Heart) හා අත (Hand) දියුණු කිරීම අධ්‍යාපනය යි.

1937 දී අධ්‍යාපනඥයන් රැසකගේ මූලිකත්වයෙන් පැවැත්වුණු වර්ධා සම්මේලනයේ දී ගාන්ධිතුමා සිය අධ්‍යාපන දර්ශනය ඉදිරිපත් කළ අතර එය මූලික අධ්‍යාපනය නමින් හැඳින්විණ. ආචාර්ය සකීර් හුසේන්, කේ.ජී. සයීඩයින් සහ විනෝබා භාවේ වැනි අධ්‍යාපන නායකයින්ගේ සහාය එම අධ්‍යාපන චින්තනයට ලබා දී තිබේ. ගාන්ධියානු අධ්‍යාපන චින්තනය 1942 දී නයිතාලිම් (Nai Talim) නම් අධ්‍යාපන සංකල්පය බිහි කිරීමට ද හේතුපාදක වී ඇත. වර්ධා සම්මේලනයේ දී ගාන්ධිතුමා පෙන්වා දුන් ප්‍රධාන සංකල්පයක් වන්නේ අකුරු ඉගෙනීම පමණක් අධ්‍යාපනය නොවන බව යි. නිදහස් හා නිවහල් ළමයෙකු බිහි කිරීම අධ්‍යාපනය වන බවත් ඒ සඳහා අධ්‍යාපන මෙන් ම ආධ්‍යාත්මික පුහුණුව ද එකසේ වැදගත් වන බවත් එතුමාගේ අදහස යි. තවත් ආකාරයකින් දක්වන්නේ නම් කායික, බුද්ධිමය හා ආධ්‍යාත්මික යන

අංශවල පුහුණුව මෙහි ලා වැදගත් වෙයි. අධ්‍යාපනය යාවජීව (දිවිය පුරා දිව යන්නක්) විය යුතු බව ගාන්ධි තුමාගේ අදහස යි (සේනාධීර සහ වනසිංහ, 2006ඃ පි. 132).

ගාන්ධිතුමා පෙන්වා දෙන්නේ පාසලේ දී අනිවාර්යෙන් උගෙනිය යුතු කරුණු දෙකක් තිබෙන බව යි.

1. නිර්භය වීම

2. කායික-මානසික පවිත්‍රතාව (සේනාධීර සහ වනසිංහ, 2006ඃ පි. 140-141).

උක්ත දැක්වෙන ගුණාංග පවතින ශිෂ්‍යයා සත්‍යවාදි, අවිහිංසා ලක්ෂණ දරන අතර දුර්වලයන්ට සහාය දීම ද සිදු කරයි.

**03. 1. නයිතාලිම් අධ්‍යාපන සංකල්පය**

නයිතාලිම් (Nai Talim) යනු මූලික නොහොත් නව අධ්‍යාපනය (Basic Education) යි. සැබෑ අධ්‍යාපනය පුද්ගලයෙකු සාක්ෂරතාවයෙන් යුක්ත කිරීම පමණක් නොව, හිස, හදවත සහ අත එනම් ජීවිතයේ බුද්ධිමය, සදාචාරාත්මක සහ ප්‍රායෝගික අංශ වර්ධනය කළ යුතු බව ගාන්ධි විශ්වාස කළේ ය. ඔහු ''ශිල්පය හරහා අධ්‍යාපනය" (Education through Craft) යෝජනා කළ අතර, එහි දී නූල් කැටීම, රෙදි විවීම හෝ කෘෂිකර්මාන්තය වැනි අතින් කරන වැඩ අනෙකුත් විෂයයන් (විද්‍යාව, ගණිතය, භාෂාව ආදිය) ඉගැන්වීමේ කේන්ද්‍රීය ක්‍රියාකාරකම බවට පත් විය යුතු බව යෝජනා කර ඇත (Gandhi, 1951: p. 12). නයිතාලම් සංකල්පය නිසා ශරීරයේ සෑම ඉන්ද්‍රියයක් ම ක්‍රියාශීලි ව පවත්වා ගත හැකි බව මෙම චින්තනය දක්වයි. මිනිසුන් එදිනෙදා ජීවිතයේ දී තම දෑත භාවිතයෙන් රැකියා කරයි නම්, රැකියා වියුක්තිභාවයක් හෝ සාගින්නක් නොපැමිණෙන බව මෙතුමා දක්වයි. ගාන්ධියානු නයිතාලිම් චින්තනයෙහි අරමුණු කිහිපයකි. ඒවානම්,

1. සදාචාරාත්මක හා අධ්‍යාත්මික චරිතයක් ගොඩනැගීම
2. බුද්ධිමය හා ශ්‍රමික ශ්‍රමය අතර පරතරය ඉවත් කිරීම

3. ශ්‍රමයේ ගරුත්වය ප්‍රවර්ධනය කිරීම
4. ස්වයංපෝෂිත, සූරාකෑමෙන් තොර සහ සමගියෙන් යුත් සමාජයක් නිර්මාණය කිරීම ආදිය යි.

නයිතාලිම් සංකල්පය සමග ග්‍රාමීය කර්මාන්ත අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ වන අතර මෙම අංශ දෙක ම සාර්ථක වූ කල්හි සත්‍ය ස්වරාජ්‍ය සංකල්පය කරා ළඟා විය හැකි බව හෙතෙම දක්වා ඇත. ඒ අනුව නයිතාලිම් සංකල්පයෙහි ප්‍රයෝජන පහත පරිදි ය.

1. ක්‍රියාවෙන් ඉගෙනීමක් ලැබීම
2. ස්වයංපෝෂිත අධ්‍යාපනයක් ලැබීම
3. ශ්‍රමාභිමානය වර්ධනය කර ගැනීම
4. උගන්වන කරුණු ජීවිතයට අදාළ කරගැනීම
5. සමෝධානිත කුසලතා වර්ධනය කරගැනීමට හැකි වීම
6. අධ්‍යාපනය ශිල්ප කේන්ද්‍රීය වීම

**04. ගාන්ධිගේ අධ්‍යාපන දර්ශනයේ මූලිකාංග**

ගාන්ධිතුමා අධ්‍යාපනය යනුවෙන් අවධාරණය කර ඇත්තේ ළදරුවා, මිනිසා, ශරීරය, සිත, ආත්මය යන අංශ ඇතුළත් පූර්ණ චිත්‍රයකට අදහස් කරන බව යි (සේනාධීර සහ වනසිංහ, 2006ඃ පි. 132). ගාන්ධියානු අධ්‍යාපන දර්ශනය අධ්‍යාපන අරමුණු පහක් පෙන්වා දෙයි.

1. සැමට ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය විය යුතු යි.
2. අධ්‍යාපනය හස්ත කර්මාන්තයක් වටා සකස් විය යුතු යි.
3. අධ්‍යාපනය තුළින් ස්වයං ආධාරක හා ස්වයං හැකියා ලබා දිය යුතු යි.
4. අධ්‍යාපනය මව් බසින් ලබා දිය යුතු යි.
5. අධ්‍යාපනය බලහත්කාරයෙන් ලබා නොදිය යුතු යි (සේනාධීර සහ වනසිංහ, 2006ඃ පි. 134).

තවත් ආකාරයකින් ගාන්ධිතුමා දක්වන අධ්‍යාපනයෙහි අරමුණු හයකි. ඒවා පහත පරිදි දැක්විය හැකි ය (සේනාධීර සහ වනසිංහ, 2006ඃ පි. 134).

| අනු අංකය | අධ්‍යාපනයෙහි අරමුණු | අපේක්ෂිත ඉලක්කය |
|---|---|---|
| 1 | උපයෝගිතා අරමුණු | මූලික අවශ්‍යතා ඉටු කරගැනීමට ඇති හැකියාව හා ජීවත් වීමට අවශ්‍ය ඉපැයීම් උදාකර ගැනීමෙහි හැකියාව ලබා දීම |
| 2 | සංස්කෘතික අරමුණු | සංස්කෘතියට අනුවර්තනය වෙමින් පෞරුෂ සංවර්ධනයට හැකියාව ලබා දීම |
| 3 | සමගිය වර්ධන අරමුණ | සියලු ශක්තීන්, දක්ෂතා ඒකාග්‍රතාව පිණිස අධ්‍යාපන වර්ධනය |
| 4 | ජීවත් වීමේ අරමුණු | ළමා කාලයේ දී ලබන අධ්‍යාපනය අඛණ්ඩ ව සිදු කරගෙන යාමට හැකියාව ලබා දීම |
| 5 | චරිත වර්ධන අරමුණු | අධ්‍යාපනයෙහි මධ්‍ය ක්‍රියාවලිය චරිත සංවර්ධනය වන බැවින් සමාජානුයෝජනය වූ පරිපූර්ණ මිනිසෙකු බිහි කිරීම |
| 6 | සමාජමය අරමුණු | ගැටලු විසඳීම, යුතුකම්-වගකීම් පිළිබඳ අවබෝධය ඇසුරෙන් පුරවැසිභාවය පිළිබඳ ආකල්පය ඇති කිරීම |

ගාන්ධිතුමා ළදරු අධ්‍යපනයෙහි පටන් උසස් අධ්‍යාපනය දක්වා අවිහිංසාව ඇති කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව අවධාරණය කර ඇත. එමගින් සමගි සම්පන්න ජාතියක් බිහි කරගැනීම අපේක්ෂාව යි.

ගාන්ධි අධ්‍යාපන ක්‍රමය අවධි හතරකින් සමන්විත වන බව පෙනේ.

පූර්ව මූලික අධ්‍යාපනය - අවුරුදු 07ට අඩු ළමුන් සඳහා

මූලික අධ්‍යාපනය - අවුරුදු 07 - 14 අතර ළමුන් සඳහා

පශ්චාත් මූලික අධ්‍යාපනය - අවුරුදු 14 වැඩි ළමුන් සඳහා

වැඩිහිටි අධ්‍යාපනය - තරුණ හා වැඩිහිටි ප්‍රජාවගේ අධ්‍යාපනය (සේනාධීර සහ වනසිංහ, 2006: පි. 145).

ගාන්ධිතුමාට අනුව ළමයාට අකුරු ඉගැන්වීමට පෙර ඇඳීමට ඉගැන්විය යුතු ය. කථාන්දර කියා දීම තුළින් සාර්ථක ව ඉගැන්විය හැකි බව එතුමා තවදුරටත් දක්වා ඇත. ගාන්ධිතුමා යෝජනා කර තිබෙන අධ්‍යාපන ක්‍රමශිල්ප පහත පරිදි ය.

1. දෑතෙහි හැකියාව ලබා දී - පාසලේ සියලු විෂයන් කර්මාන්ත සමඟ සම්බන්ධ විය යුතු අතර ප්‍රයෝගික අධ්‍යාපනය මගින් නිෂ්පාදන කාර්යයට යොමු කරවීම.
2. ක්‍රියාකාරකම් තුළින් ඉගැන්වීම - ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමයෙහි අපේක්ෂාව නම් ක්‍රියාවෙන් අවබෝධය යි.
3. සහසම්බන්ධතා ක්‍රමය - විෂයන් වෙන වෙන ම නොව අන්‍යෝන්‍ය වශයෙන් සබඳතා පවතින බව පෙන්වා දීම.
4. මව්බසින් ඉගැන්වීම - මව්බසින් ඉගැන්වීම මගින් ජීවන අත්දැකීම් ද අධ්‍යාපන ක්‍රියාවලියට එක් කරගැනීමට හැකියාව ලැබේ (සේනාධීර සහ වනසිංහ, 2006: පි. 158).

## 05. ගාන්ධි අධ්‍යාපනය දර්ශනයේ සර්වකාලීන අගය

ගාන්ධි අධ්‍යාපන දර්ශනය දේශ, කාල, භූමි භේදවලින් තොර ව සෑම කෙනෙකුන්ට ම උපයෝගී කරගත හැකි සංස්කෘතියකි. එතුමා පෙන්වා දුන්නේ ජීවත් වීම සඳහා ජීවිතය තුළින් ජීවිතාන්තය තෙක් ලබන දැනුම අධ්‍යාපනය බව යි. එක් අතකින් එය යාවජීව (දිවිය පුරා

දිව යන) අධ්‍යාපන ක්‍රමයකි. එතුමා ශිෂ්‍යයෙකු තුළ ඇති කරගත යුතු චින්තන කිහිපයක් දක්වා ඇත්තේ මෙසේ ය.

1. ස්වයං විනය - ජාතික අවශ්‍යතාවන්ට අනුරූපී වන පරිදි විවිධ ක්ෂේත්‍ර සඳහා නායකත්වය ලබා දීමට හැකියාව ඇති කරගැනීම
2. රැකියාගත වීම - ජාතික අවශ්‍යතාවන් කෙරේ ද අවධානය යොමු කරමින් රැකියාගත වීම
3. ජාතිය පෝෂණය කිරීම - උපයන වේතනයෙන් කොටසක් ජාතිය ගොඩනැංවීමට ප්‍රදානය කිරීම
4. සහජීවනය - ජාති, ආගම් හා කුල නොතකා සුහදතාවයෙන් යුතු ව වාසය කිරීම
5. ස්වයං පෝෂණය - ස්වකීය අවශ්‍යතා තමන් විසින් ම උත්පාදනය කරගැනීම
6. ජාතික සංවර්ධනය - පුද්ගලික ධනය, ශ්‍රමය, කාලය ජාතිය සංවර්ධනයට ප්‍රදානය කිරීම (සේනාධීර සහ වනසිංහ, 2006ඃ පි. 143-144).

ඉහත දැක්වෙන අධ්‍යාපන ඉලක්ක සපුරා ගනු වස් ගාන්ධි තුමා විෂයමාලාවකට ඇතුළත් විෂය කිහිපයක් ද දක්වා ඇත. ඒ පහත පරිද්දෙනි.

1. මූලික ශිල්ප කර්මාන්තයක්
2. මව්බස
3. සංස්කෘතිය
4. වෙනත් භාෂා
5. චිත්‍ර
6. ශාරීරික අධ්‍යාපනය
7. ගණිතය
8. විද්‍යාව

9. සාහිත්‍ය

10. සංගීතය

11. ආගම

12. සමාජ අධ්‍යාපනය (සේනාධීර සහ වනසිංහ, 2006: පි.148).

මෙබඳු විෂය සංකලනයක මූලික අපේක්ෂාව චිත්තවේග පාලනය, මානසික පුහුණුව, කායික හා ආධ්‍යාත්මික පුහුණුව ආදිය යි. එසේ ම ආගම ඉගැන්වීමෙන් සත්‍ය, අවිහිංසාව හා තෘප්තිමත් බව ඇති කරවීම අපේක්ෂා කෙරේ. මිනිසෙකුට ආගමක් නැති ව ජීවත් වීමට සිතීම නහයක් නැති ව හුස්ම ගැනීමට යාමක් බඳු බව මෙතුමාගේ අදහස යි. එහි දී තම ආගම පමණක් නොව සෙසු ආගම් ද ඉගෙනීම තුළින් ආගමික සහජීවනයට ඍජු ව අදාළ බව ගාන්ධි චින්තනයෙහි අවධාරණය යි.

ගාන්ධියානු අධ්‍යාපන චින්තනය ගුරුවරයාට වැදගත් තැනක් ලබා දෙයි. ගුරුවරයා වනාහි පුද්ගල අත්දැකීම් සම්ප්‍රේෂණය කරන ප්‍රවාහකයෙකි. ගුරුවරයාගේ බුද්ධිය, ශක්තිය හා ආධ්‍යාත්මික ගුණාංග සිසු පෞරුෂයට ඍජුව ම බලපෑම් කරන බව මෙහි ප්‍රමුඛ අදහස යි. ඒ අනුව ගාන්ධිතුමා ගුරුවරයෙකු තුළ තිබිය යුතු මූලික ලක්ෂණ කිහිපයක් දක්වා තිබේ. එනම්,

1. ඉහළ බුද්ධි මට්ටම

2. මනා චිත්තවේග පාලනය

3. මනා මානසික සංවිධානය

4. නිර්මාණශීලී බව

5. උසස් අභිලාෂ

6. මනා සිහිකල්පනාව ආදිය යි (සේනාධීර සහ වනසිංහ, 2006: පි. 155).

ගාන්ධිට අනුව සෑම පුද්ගලයෙකු ම උපත ලබා ඇත්තේ මූලික සහ සහජ හැකියා සමූහයකිනි. අධ්‍යාපනය නෛසර්ගික හැකියාවන් ඉස්මතු කිරීම සඳහා ය. එය කළ හැක්කේ න්‍යායාත්මක හා

ප්‍රායෝගික ප්‍රවේශ උපයෝගි කරගැනීම මගිනි. එතුමා "නිරත වීම මඟින් ඉගෙනීම" (Learning by doing) යන සංකල්පය හඳුන්වා දී ඇත්තේ ද උක්ත දැක්වෙන පදනමෙනි. එම ඉගැන්වීම් ශෛලිය ප්‍රායෝගික ක්‍රියාවන්ට මඟ පෙන්වන අතර ආදර්ශය මතු වන පරිද්දෙන් සිය අධ්‍යාපන දර්ශනය ගොඩ නගා ඇත. අධ්‍යාපනය තුළින් පුද්ගලයාගේ භෞතික හා ආධ්‍යාත්මික සමබර ජීවිතයක් ඇති කළ හැකි බව එතුමාගේ අදහස යි.

**6. සමාලෝචනය**

මහත්මා ගාන්ධිතුමාගේ අධ්‍යාපන දර්ශනය ඉතා වැදගත් හා කල් පවතින වටිනාකමකින් යුක්ත වන්නේ එය මානව සංවර්ධනය පිළිබඳ සම්පූර්ණ හා සමබර දැක්මක් ඉදිරිපත් කරන බැවිනි. සැබෑ අධ්‍යාපනය හිස, හදවත සහ අත පුහුණු කළ යුතු බව ඔහු විශ්වාස කළේ ය. එමගින් බුද්ධිමය හැකියාව, සදාචාරාත්මක චරිතය සහ ප්‍රායෝගික කුසලතා එකට වර්ධනය කිරීම අපේක්ෂාව විය.

| අනු අංකය | සංවර්ධනය විය යුතු අංශය | කේන්ද්‍රීය ඉලක්කගත අංශය | අපේක්ෂිත තත්ත්වය |
|---|---|---|---|
| 1. | අධ්‍යාපනයෙන් පුද්ගල හිස පුහුණු කිරීම | ප්‍රජානන අංශය | බුද්ධිමය හැකියාව වැඩි දියුණු කිරීම |
| 2. | අධ්‍යාපනයෙන් පුද්ගල හදවත පුහුණු කිරීම | චර්යාමය අංශය | සදාචාරාත්මක පෞරුෂයක් ඇති කිරීම |
| 3. | අධ්‍යාපනයෙන් පුද්ගල අත පුහුණු කිරීම | කුසලතා හෙවත් ප්‍රායෝගික අංශය | ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම |

නයිතාලිම් හෙවත් මූලික අධ්‍යාපනය ලෙස හැඳින්වෙන ඔහුගේ ප්‍රවේශය මගින් සැබෑ ජීවිත අත්දැකීම් සහ ප්‍රයෝජනවත් වැඩ හරහා ඉගෙනීමට වැදගත්කමක් ලබා දෙයි. සදාචාරාත්මක හා අධ්‍යාත්මික වටිනාකම මෙම අධ්‍යාපන චින්තනයෙහි ප්‍රධාන අංශයකි. ගාන්ධි අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයේ සදාචාරාත්මක හා අධ්‍යාත්මික

වර්ධනය අවධාරණය යි. අධ්‍යාපනය යහපත් චරිතය, ස්වයං විනය, සත්‍යය සහ අනුකම්පාව වර්ධනය කිරීමට හේතු විය යුතු බව ඔහු විශ්වාස කළේ ය. ඔහුගේ මතය අනුව, ඉගෙනීමේ අරමුණ වූයේ සමාජයට ප්‍රයෝජනවත්, සාමකාමී සහ ගුණවත් මිනිසෙකු වර්ධනය කිරීම යි.

සමාජ වටිනාකම ප්‍රවර්ධනය ද මෙම අධ්‍යාපන චින්තනයෙහි තවත් ප්‍රධාන අංශයකි. ගාන්ධිගේ අධ්‍යාපන ක්‍රමයට ශක්තිමත් සමාජ අරමුණක් තිබුණි. එය ප්‍රජාවට සේවය කිරීමට සහ සියලු මිනිසුන් අතර සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට අදහස් කර ඇත. මානසික සහ අතින් කරන වැඩ වෙන් වෙන් ව පවතින බවත්, ශ්‍රමයට සහ ඉගෙනීමට සමාන ගෞරවයක් ලබා දෙන බවත් යන අදහස ඔහු ප්‍රතික්ෂේප කළේ ය. ඔහුගේ දර්ශනය සහයෝගීතාවය, අන් අයට සේවය කිරීම සහ සෑම ආකාරයක ම අවංක වැඩ සඳහා ගරු කිරීම දිරිමත් කළේ ය.

ආර්ථික වටිනාකම ද ඔහුගේ අධ්‍යාපන චින්තනයෙහි ප්‍රධාන අංශයකි. අධ්‍යාපනය ඵලදායී වැඩ සහ අත්කම්වලට සම්බන්ධ කිරීමෙන් ගාන්ධි අධ්‍යාපනය ආර්ථික වශයෙන් අර්ථවත් කළේ ය. ඔහුගේ අරමුණ වූයේ ඉගෙන ගන්නන් ස්වයංපෝෂිත කිරීම සහ ඔවුන්ගේ කුසලතා තුළින් තම ජීවනෝපාය උපයා ගැනීමට හැකියාව ලබා දීම යි. අධ්‍යාපනය ජීවනෝපාය සඳහා පමණක් නොව සරල, ස්වයංපෝෂිත සහ අර්ථවත් ජීවිතයක් නිර්මාණය කිරීම සඳහා ද වැදගත් විය. ගාන්ධිතුමා සංස්කෘතික හා ජාතික වටිනාකම සිය අධ්‍යාපනික දර්ශනයෙහි ප්‍රධාන අංශයක් ලෙස සැලකූ අතර ඉන්දියානු සංස්කෘතිය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම එහි අරමුණ විය. ඔහු මව් භාෂාව ඉගැන්වීමේ මාධ්‍ය ලෙස භාවිත කිරීම දිරිමත් කළ අතර දේශීය සම්ප්‍රදායයන්, කලා සහ ශිල්ප අගය කළේ ය. මේ හරහා, සංස්කෘතික අනන්‍යතාවය, සදාචාරාත්මක ශක්තිය සහ ජාතික සමගිය පිළිබඳ ශක්තිමත් හැඟීමක් ගොඩනැගීමට ඔහු බලාපොරොත්තු විය. තව ද ගාන්ධියානු අධ්‍යාපන චින්තනයෙහි විශ්වයීත්වය එහි මනෝවිද්‍යාත්මක සහ ප්‍රායෝගික වටිනාකම් ඇසුරෙන් ද සාකච්ඡා කළ හැකි අතර ගාන්ධිගේ ''නිරත වීම මඟින් ඉගෙනීම" එහි ලා වැදගත් කරුණකි. මෙම ක්‍රමය දරුවන්ට අධ්‍යාපනය ස්වාභාවික හා

වින්දනයෙන් යුතු ව සිදු කරගත හැකි අයුරු එතුමා පෙන්වා දී ඇත. එමගින් දැනුම සැබෑ ජීවන තත්ත්වයන් සමඟ සම්බන්ධ කළ හැකි අතර ම නිර්මාණශීලිත්වය සහ ගැටලු විසඳීමට ද දිරිමත් කරන්නකි. මෙම ප්‍රවේශය එක් එක් ශිෂ්‍යන්ගේ පෞද්ගලිකත්වයට ද ගරු කරන අතර ප්‍රායෝගික අත්දැකීම් තුළින් විශ්වාසය හා සුහදශීලී බව වර්ධනය කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අලහකෝන්, යූ., (2006). *මහත්මා ගාන්ධි.* කොළඹ 10ඃ ගොඩගේ ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, එස්., (2013). *මොහාන්දාස් කරම්චන්ද් ගාන්ධිඃ දුරින් හිඳ පියාණෙනි.* නුගේගොඩඃ සංහිඳ ප්‍රකාශන.

රංජිත්, ආර්., (1997). *නව අධ්‍යාපන සංකල්ප.* කොළඹ 10ඃ ගොඩගේ ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, වි., (1994). *මහත්මා ගාන්ධි හෙවත් ධර්ම සංග්‍රාම සහ අදාන්ත ආණ්ඩු දමන.* කොළඹ 10ඃ ගොඩගේ ප්‍රකාශකයෝ.

විජේසූරිය, එස්., (1999). *සත්‍ය දෙවියන් යඃ මහත්මා ගාන්ධි.* කෝට්ටේඃ සහභාගීත්ව සංවර්ධන පර්ෂදය.

වීරසිංහ, එච්., (1997). *අධ්‍යාපන සංකල්පඃ පෙරදිග හා අපරදිග.* කොළඹ 10ඃ ගොඩගේ ප්‍රකාශකයෝ.

සේනාධීර, එස්., වනසිංහ, එස්., (2006). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශය.* කොළඹ 10ඃ ගොඩගේ ප්‍රකාශකයෝ.

Gandhi, M. K. (1951). *Basic Education (Nai Talim).* Ahmedabad: Navajivan Publishing House.

Jothi, K. (2002). *Gandhian Philosophy of Education.* New Delhi: Anmol Publications.

Nanda, B. R. (2009). *Mahatma Gandhi: A Biography.* New Delhi: Oxford University Press.

National Council of Educational Research and Training (NCERT). (2005). *Education in India: Historical Perspectives*. New Delhi: NCERT.

Pathak, R. P. (2014). *Philosophical and Sociological Perspectives of Education.* Delhi: Atlantic Publishers.

Report of the Zakir Husain Committee. (1938). *Basic National Education: The Wardha Scheme*. Government of India, Ministry of Education.